**ශීර්ෂය - 324 - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව**

**-------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 මතය**

**-------**

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**2.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

----------------------------------------------

වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලසුමේ දක්වා ඇති කාර්යයන්වල අපේක්ෂිත අරමුණු සියයට සියයක් ඉටුකරගැනීමට නොහැකිවූ අවස්ථා තිබූ බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අභ්‍යන්තර විගණන කාර්යමණ්ඩලයේ ධාරිතාවය දියුණු කිරීමට ප්‍රධාන අභ්‍යන්තර විගණක හා අභ්‍යන්තර විගණකයින් සහ අනෙකුත් කාර්යමණ්ඩල සඳහා වන පුහුණු වැඩසටහන් සංඛ්‍යාවේ අපේක්ෂිත නිමැවුම සියයට 50 – 74 ක් වුවද තථ්‍ය නිමැවුම සියයට 50 කට අඩු මට්ටමක පැවතුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා ඇති අරමුණු ඉටුකිරීමේදී 2020 වර්ෂය සඳහා අපේක්ෂිත කාර්යසාධනය දක්වා ඇත. වර්ෂය තුළ අපේක්ෂා කල කාර්යසාධන පරාසය තුල මෙම සත්‍ය කාර්යසාධනය ලබාගෙන ඇත්තේ 2020 වර්ෂය තුල ඇති වූ කොවිඩ් වසංගත තත්වය මත වේ. එහිදී අපේක්ෂා නොකල හේතු මත අපේක්ෂිත කාර්යසාධනයේ උපරිමය වෙත ලගාවීමට නොහැකි වී ඇත. | ඉලක්කගත කාර්යසාධන මට්ටම් කරා ලඟාවීමට උපරිම අයුරින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය |
| (ආ) | අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් මඟින්, විගණන හා කළමනාකරණ කමිටුවෙහි සුමට ක්‍රියාවලිය සහතික කිරීම සහ රාජ්‍ය | 2020 වර්ෂය තුළ සැලසුම් කල පරිදි අමාත්‍යාංශ 30, දෙපාර්තමේන්තු 45, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25, පළාත් පාලන ආයතන 09 හා විශේෂ වියදම් ඒකක 10 ට අදාලව ප්‍රශස්ත මට්ටමින් විගණන හා | -එම- |

| | |
|---|---|
| අංශ ගිණුම් කටයුතු ශක්තිමත් කිරීමේ අපේක්ෂිත නිමැවුම සියයට 50 සිට 74 ක් දක්වා පරාසයක වුවද තථ්‍ය නිමැවුම සියයට 52 ක්ව පැවතුණි. | කළමනාකරණ කමිටු සඳහා නියෝජිතයන් පත්කරන ලදි. ගෝලීය කොවිඩ් වසංගත තත්වය හමුවේ දෙවන කාර්තුවේ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමේ දුෂ්කරතාවය හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලදි. තුන්වන හා හතරවන කාර්තුවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට උපදෙස් ලබා දෙන ලද අතර, මෙම කොවිඩ් වසංගත තත්වය හමුවේ ද 2020 වර්ෂය අවසානයේ විගණන හා කළමනාකරණ කමිටු 241 ට දෙපාර්තමේන්තු නියෝජිතයන් සහභාගී වූ බවත් දන්වා එවා තිබුණි. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත අනුමත සේවක සංඛ්‍යාවෙන් 05 ක් හෙවත් සියයට 09 ක් පුරප්පාඩුව පැවතුණි. | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ සේවක පුරප්පාඩු 05 ක් පැවති අතර ඉන් එක් තනතුරක් කාර්යාල කාර්ය සහායක පුරප්පාඩුවක් මේ වනවිට එම පුරප්පාඩුව සම්පූර්ණ කර ඇති බවත්, ඉතිරි පුරප්පාඩු 04 රියදුරු සේවයේ වූ අතර එම පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවයන් මෙතෙක් පැන නැඟී නොතිබුණු බැවින්, ඒවා අහෝසි කිරීම සඳහා අදාල අංශ දැනුවත් කර මේ වනවිට කටයුතු කරමින් පවතින බවත් දන්වා එවා තිබුණි. | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩුව පිරවීමට හෝ එසේ නොවන්නේ නම් එම තනතුරු අහෝසි කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |